## මුලටියන ප්‍රාදේශීය සභාව.

## මාතර දිස්ත්‍රික්කය.

### 1. මූල්‍ය ප්‍රකාශන.

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලොචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 අගෝස්තු 04 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 නොවැම්බර් 22 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය.

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මුලටියන ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට මුලටියන ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මූල්‍ය ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුණ නිරීක්ෂණය විය.

(අ) 1999 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එමින් තිබෙන ලී බඩු හා සවිකිරීම් ගිණුමේ රු. 557,364 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂයේදීද හඳුනාගැනීමකින් හා තහවුරු කර ගැනීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේදී නිම කරන ලද කර්මාන්ත 02 ක අගය වූ රු.521,650 ක් සමාලෝචිත වර්ෂයේදීද ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ඉඩම් අත්පත් කර ගැනීම හා පෙර පාසැල් හතරක් සඳහා ක්‍රීඩා උපකරණ වෙනුවෙන් දරන ලද රු.105,250 ක් වූ වියදම් ප්‍රාග්ධනිත නොකොට පුනරාවර්තන වියදම් ලෙසට ගිණුම් ගත කර තිබුණි.

(ඈ) 2010 වර්ෂයේ ජුනි, ජුලි, අගෝස්තු, සැප්තැම්බර්, හා ඔක්තෝබර් මාසවලට අදාල මුද්දර ගාස්තු සකස් කිරීමේ දීමනාව ලෙස රු.9,475 ක් 2011 වර්ෂයේදී ගෙවා තිබුණද ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඉ) 2010 වර්ෂය මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ රු.79,837,830 ක් වටිනා ණයගිම් ශේෂය තුල 2009 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නිමකරන ලද රු.1,547,647 ක් වූ ණයහිමියන් ඇතුලත් වී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.1,199,986 ක දායක මුදල් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්.

ගිණුම් විෂයයන් 04 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 80,948,506 ක් වූ අතර උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ එකතුව රු.79,790,518 ක් වූයෙන් රු.1,157,988 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොවීම නිසා ගිණුම් විෂයයන් 09 කට අදාල රු.182,164,193 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.4 අනුකූල නොවීම්.

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 164 | සභාවේ ගිණුම් ලියකියවිලි ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දිනපතා පරීක්ෂා කර ඒ බවට කෙටි අත්සන් තැබීම මගින් තහවුරු කර නොතිබුණි. |
| (ii) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයන්හි තථ්‍ය ශේෂය සසඳා අතිරික්ත හා ඌණතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛ අංක අයිඑ්අයි 2002/02 | පරිගණක 02 ක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,731,910 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,547,267 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු 2011 ජනවාරි 20 දිනැති මාගේ ලිපියෙන් නියමිත ආකෘතියක ඉදිරිපත් කරන ලෙස සභාපතිවරයාගෙන් ඉල්ලා තිබූ නමුත් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තබූ හිඟ ආදායම් ප්‍රකාශ අනුව 2010 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය ඉකුත් වර්ෂය සමඟ සසඳා සාරාංශ කර පහත දක්වා ඇත.

| විස්තරය | හිඟ ආදායම | | වැඩිවීම ප්‍රතිශතයක් ලෙස | අඩුවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | 2010 | 2009 | | |
| | රු. | රු. | % | % |
| වරිපනම් හා අක්කර බදු | 77,759 | 64,412 | 20.72 | - |
| බදු කුලී | 392,750 | 334,237 | 17.5 | - |
| බලපත්‍ර ගාස්තු | 39,050 | 43,230 | - | 9.6 |

### 2.2.2 හිඟ බදු හා ගාස්තු

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවලට අදාලව අයවිය යුතු රු.77,759 ක බදු හා ගාස්තු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 ප්‍රචාරක දැන්වීම් - දෘෂ්‍ය පරිසරය

සභා බල ප්‍රදේශයේ දෘෂ්‍ය පරිසරය යටතේ ප්‍රදර්ශනය කෙරෙන ප්‍රචාරක දැන්වීම් සඳහා 2009 නොවැම්බර් 27 දිනැති අංක 1630 දරන ගැසට් නිවේදනයෙන් ගාස්තු පනවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ප්‍රදර්ශනය කෙරෙමින් තිබූ ප්‍රචාරක දැන්වීම් 11 කින් රු.16,675 ක් අයකර ගෙන නොතිබුණි.

### 2.2.4 පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර සංවර්ධන පනත සහ ඒ යටතේ වූ රෙගුලාසිවලට අනුකූලව 2008 ජනවාරි 25 දිනැති අංක 1533/13 දරන ගැසට් පත්‍රයේ (ඇ) කොටසේ උපදෙස් පරිදි පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ආයතන 107 කින් රු.714,000 ක බලපත්‍ර ගාස්තු හා පරීක්ෂා කිරීම් ගාස්තු අයකර ගෙන නොතිබුණි.

### 2.2.5 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ 02 කින් 2010 දෙසැම්බර් 31 දින දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු.393,958 ක් වූ දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

### 2.2.6 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.2,103,336 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

### 2.2.7 වෙළඳ බලපත්‍ර ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(1)(2)(3)(4) උප වගන්ති අනුව සමාලෝචිත වර්ෂයට අදාල වෙළඳ බලපත්‍ර ගාස්තු බිල් කර නොතිබුණි. පනතේ 152(4) පරිදි ව්‍යාපාර වර්ග 12 කට අයත් බලපත්‍රලාභීන් 34 දෙනෙකුගෙන් 2010 දෙසැම්බර් 31 දිනට හිඟව තිබූ රු.13,200 ක මුදලක් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.3 වියදම් ව්‍යුහය.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | '000 | '000 | '000 | '000 | '000 | '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 11,874 | 9,937 | 1,937 | 12,098 | 9,854 | 2,244 |
| අනෙකුත් | 4,284 | 3,719 | .565 | 4,775 | 3,101 | 1,674 |
| උප එකතුව | 16,158 | 13,656 | 2,502 | 16,873 | 12,955 | 3,918 |
| ප්‍රාග්ධන වියදම | 109,250 | 154,741 | (45.491) | 101,936 | 59,363 | 42,573 |
| මුළු එකතුව | 125,408 | 168,397 | (42,989) | 118,809 | 72,318 | 46,491 |

## 2.4 මානව සම්පත් කළමනාකරණය.

### 2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | - |
| ද්විතියික | 14 | 13 |
| ප්‍රාථමික | 10 | 10 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 18 |
| එකතුව | 25 | 31 |

==== ===

(අ) සමාලෝචිත වර්ෂයේ ලේඛණ අනුව කාර්ය මණ්ඩල වැටුප් සඳහා වූ වියදම රු.9,937,436 ක් වුවද පළාත් පාලන කොමසාරිස් විසින් පතිපූර්ණය කර තිබුණේ රු.9,045,000 ක් පමණක් වූ හෙයින් රු.892,436 ක වෙනස සභා අරමුදලට වැය බරක් වී තිබුණි.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 හා 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 හා අංක 28 මගින් පළාත් පාලන ආයතන වල අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවකයින් බඳවා ගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධාන වලට පටහැනිව සේවකයින් 18 ක් බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් වශයෙන් සභා අරමුදලින් රු.1,614,793 ක මුදලක් ගෙවා තිබුණි. මෙම චක්‍රලේඛ උපදෙස් අභිබවා යමින් බඳවා ගැනීම් සිදුකලහොත් ආයතනය ප්‍රධානියා ඒ සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳී සිටින බවද අවධාරණය කර තිබුණි.

2.5. <u>වත්කම් කළමනාකරණය.</u>

<u>අයවීමට ඇති සේවක ණය.</u>

2010 දෙසැම්බර් 31 දිනට ලේඛණ අනුව අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.1,523,012 ක් විය.

2.6 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

<u>වීථිපහන් නඩත්තුව.</u>

(i) වීථි පහන් නඩත්තුව සම්බන්ධයෙන් විදුලි උපාංග මිලදී ගැනීමේදී අවශ්‍යතාවය පරිදි නඩත්තු විදුලි කාර්මිකගේ ඉල්ලීම හා ඒ සඳහා කාර්මික නිලධාරියාගේ අනුමැතිය මගින් ඒවා මිලදී ගැනීම සිදුකල යුතු වුවත් එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ii) සභා බල ප්‍රදේශය තුල නඩත්තු කරන වීථි පහන් එකිනෙක වෙන්කොට හඳුනාගැනීම සඳහා අංක හෝ සංකේත ක්‍රමයක් භාවිතා කරමින් එක් එක් වීථි පහන් සඳහා විදුලි බුබුළු හා අනෙකුත් උපාංග සවි කිරීම සම්බන්ධයෙන් ලේඛණයක් පවත්වා නොතිබුණි.

(iii) සභා බල ප්‍රදේශයේ වීථිපහන් නඩත්තුව සඳහා සභා අරමුදලින් රු.79,650 ක් වැයකර තිබුණද ලංකාවිදුලි බල මණ්ඩලය සමග ගිවිසුම් අත්සන් කර නොතිබූ බැවින් කිසිදු මුදලක් ප්‍රතිපූර්ණය කරගත නොහැකි වී තිබුණි.

3. <u>පද්ධති හා පාලන.</u>

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය

(ඈ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය